**කලවාන ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**--------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

පිරිවැය රු. 1,145,000 ක් වූ ඩබල් කැබ් රථයක් 2015 ජූනි 11 දින රු. 929,750 කට විකුණා තිබුණද, 2015 වර්ෂයේ ගිණුම් වලින් ඉවත් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදීද එය නිවැරදි කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු. 1,145,000 කින් වැඩියෙන් දැක්වුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**----------------------------**

ගිණුම් විෂයයන් 12 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 24,549,811 ක වෙනසක් විය.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**-----------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් යටතේ දක්වා තිබූ රු. 39,211 ක් වූ වැසිකිලි බදු සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,776,084 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,331,362 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,444,722 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-------------------------------------**

මූල්‍ය ප්‍රතිඵලය රු. 3,444,722 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 02 ක රු. 4,516,290 ක වර්ධනය හා වියදම් විෂයයන් 02 ක රු. 3,414,015 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 මූල්‍ය පාලනය**

**-----------------**

බැංකු ගිණුම් 03 කට අදාලව මුදල් පොතේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර පැවති එකතුව රු. 48,905 ක් වූ වෙනස සම්බන්ධයෙන් අදාල නිරවුල් කිරීම් කර නොතිබුණි.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' |
| වරිපනම් හා බදු | 7,530 | 6,200 | 4,205 |
| බදු කුලී | 4,368 | 328 | 5,134 |
| බලපත්‍ර ගාස්තු | 1,207 | 330 | _ |
| වෙනත් ආදායම් | 34,635 | 28,810 | 11,128 |

### 2.4.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වෙනත් ආදායම් විෂයයෙහි රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 8 කින් වැඩි වී තිබූ අතර වරිපනම් හා බදු, බදුකුලී ආදායම, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු හා වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 70, සියයට 33, සියයට 72, සියයට 21 හා සියයට 53 කින් අඩුවී තිබුණි.

### 2.4.3 වරිපනම්

2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 2,639,591 ක් වූ අතර, ඒ තුල රු. 10,000 ට වැඩි හිඟයක් සහිත වරිපනම් ඒකක 68 ක් පැවති අතර, අදාල හිඟය රු. 1,257,768 ක් හෙවත් මුළු හිඟයෙන් සියයට 48 ක් විය.

### 2.4.4 බදුකුලී

--------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් මස් කඩයක් හා මාළු ලැල්ලක් වෙනුවෙන් 2014 වර්ෂයට අදාල එකතුව රු. 669,918 ක් වූ හිඟ කුලිය 2017 අප්‍රේල් 28 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) කලවාන සතිපොල සඳහා 2016 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු. 408,400 ක් වූ හිඟ බදු සහ දඩ මුදල 2017 අප්‍රේල් 22 දින වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 2.4.5 වෙනත් ආදායම්

-----------------

1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසේ 39 වන පරිච්ඡේදයේ 01 අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, ප්‍රදර්ශනය කරන බැනර් හා ප්‍රචාරක දැන්වීම් 05 කින් පමණක් රු. 18,056 ක ආදායමක් උපයා තිබුණි. ගාස්තු අයකල යුතු බැනර් හා කටවුට් 07 කින් ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

අයවැය ලේඛනය අනුව 2016 වර්ෂයේදී කර්මාන්ත සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත් ප්‍රගති වාර්තාවට අනුව විමධ්‍යගත අරමුදල් යටතේ එකතුව රු. 2,607,979 ක් වැයකර කර්මාන්ත 03 ක්ද, පළාත් සභා අරමුදල් යටතේ එකතුව රු. 2,172,264 ක් වැයකර කර්මාන්ත 07 ක්ද ක්‍රියාත්මක කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

ආදායම් නිලධාරියා විසින් එකතු කරන ලද ආදායම් මුදල් එදිනම සභාවට භාරදී නොතිබුණු අතර, සභාවට මුදල් භාරදෙන සෑම අවස්ථාවකදීම එදින දක්වා එකතු කරන ලද මුළු ආදායමෙන් දෛනිකව රු. 20,000 ත් රු. 40,000 ත් අතර මුදලක් දින 03 සිට දින 10 දක්වා කාලයක්

අතරදවාගෙන සභාවට මුදල් භාරදී තිබූ බව අනාවරණය විය. ඒ අනුව දෛනික ආදායම අතරදවා ගැනීම තුලින් සහා අරමුදල් පෞද්ගලික පරිහරණයට යොදා නොගන්නේ යැයි විගණනයේදී බැහැර කල නොහැකි විය.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දින වනවිට අක්‍රීය බැංකු ගිණුම් 03 ක එකතුව රු. 273,361 ක් වූ ශේෂයක් පැවතුණු අතර, එම මුදල් ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගෙන නොතිබුණි.

(ආ) සභාව සතු මස් කඩය හා මාළු කඩ 05 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට ටෙන්ඩර් ඉදිරිපත් නොකිරීම සහ කෙටි කාලයකින් ටෙන්ඩරය අත්හැරීම හේතුවෙන් අපේක්ෂිත ආදායම ඉපයීමට අපොහොසත් වී තිබුණු අතර, එම කඩ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

සභාව සතු ට්‍රැක්ටර් දෙකක් සහ ට්‍රේලර් දෙකක් 2005 ජූලි සිට නිෂ්කාර්යයව පැවතුණු අතර, 2017 ජූලි වනවිටත් අදාල අළුත්වැඩියාවන් සිදුකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කලවාන දොලහේන පාර අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය රු. 1,038,991 ක් වැයකර නිමකර තිබුණද, එක් වැඩ විෂයක් යටතේ ඉටුකර තිබුණු ප්‍රමාණයට වඩා වැඩියෙන් රු. 25,775 ක් ගෙවා තිබුණි.

(ආ) පනාපොල කොස්ගුලන මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු. 1,026,178 ක් ගෙවා තිබූ අතර, ගෙවීම් වාර්තාවේ එක් වැඩ විෂයක් යටතේ 1:2:4 ($^{3}/_{4}$) මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීම සඳහා ඝන මීටරයකට රු. 14,381 ක් බැගින් ගෙවා තිබුණද, සබරගමුව පළාත් මාර්ග මිල ලේඛනය අනුව ඝන මීටරයකට ගෙවිය යුතු වටිනාකම රු. 13,657 ක් වූයෙන් ඝන මීටර් 60.59 ක් සඳහා රු. 43,806 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභාව විසින් දිරන හා නොදිරන කසළ වෙන්කර භාර ගැනීම සිදුකලද, බැහැර කිරීමේදී වලවල් වලට දමා පිලිස්සීම කර තිබූ බව හා පිලිස්සීමට භාජනය නොවන කසළ සම්බන්ධයෙන් විධිමත් කළමනාකරණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ වැය විෂයයන් 36 ක් සඳහා ප්‍රතිපාදිත මුළු එකතුව වූ රු. 1,642,830 ක් සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම රු. 2,224,698 ක් වූ විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වර්ෂයට අදාල නියමිත ආදායම හඳුනා නොගැනීම |
| | | (ii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ඉටු නොකල කාර්යයන් සඳහා ගෙවීම් කිරීම |
| (ඉ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |
| (ඊ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් ලෙස බැහැර නොකිරීම |